**ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.2 ඡේදයට අනුව වාර්තාකරන ආයතනයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම් වියදම් සහ ප්‍රධාන ලෙජර් ශේෂයන් සමග එකග වන බවට සහතික විය යුතු බව දක්වා තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ ACA2, ACA2(i), ACA2 (iii), ACA2(iv), ACA2(v) හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සටහන 05, 06, 07, 10, 11, 14, 15 හි දක්වා ඇති වාර්ෂික අයවැය ප්‍රතිපාදන වටිනාකම රු.547,871,000කින් භාණ්ඩාගාර වාර්තා අනුව නොසැසදුණි. 2021 අගෝස්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අනුව කටයුතු කර අයවැය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන නැවත හරවා යැවීම හේතුවෙන් මෙම විචලතාවන් ඇති වී ඇති බව මෙම නොසැසදීම් වලට හේතුන් ලෙස ACA 2(111) ආකෘතියෙහි දක්වා තිබුණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන වලින් ඉතිරිකිරීමට අපේක්ෂිත ප්‍රතිපාදන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් 2021 සැප්තැම්බර් 15 හෝ එදිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්රුන්ට නියම කර තිබුණි. නමුත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍ය මණ්ඩල තීරණය පදනම්ව වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙනස් කර දක්වා තිබුණි. | 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සියළු අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන වලින් ඉතිරි කිරීමට අපේක්ෂිත ප්‍රතිපාදන පිළිබඳ වාර්තාවක් 2021.09.15 හෝ ඊට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි.<br><br>නමුත් උක්ත සංදේශය අනුව දන්වා යවන ලද ප්‍රතිපාදන ඉතිරිකිරීමේ ගිණුම් ගත කල යුතු ආකාරය පිළිබඳ පැහැදිලි උපදෙස් 2021 දෙසැම්බර් 31 දින වන විටත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් ලබා දී නොතිබුණි. ඒ අනුව ප්‍රතිපාදන ඉතිරිකිරීම් පිළිබඳව නිවැරදිවම දැක්වීම සිදු කල යුතුව ඇති බැවින් ජාතික ආදායම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන ලද එක් එක් වැය ගිණුම්වල ප්‍රතිපාදන ඉතිරිකිරීම් CIGAS පද්ධතියේ SAVING ලෙස අඩුකර දන්වන ලදි. එසේම මෙම අයකිරීම් පිළිබඳව පැහැදිලිව දන්වා 2021 වර්ෂයේ මාසික ගිණුම් සාරාංශ 2 ක් වෙත ඉදිරිපත් කර ඇති එසේම 2022 ජනවාරි මාසයේද සංශෝධිත ගිණුම් සාරාංශයේද මෙම ඉතිරිකිරීම් දක්වමින් දෙපාර්තමේන්තුව වෙත අවසන් ගිණුම් සාරාංශය ඉදිරිපත් කර ඇති බවට කාරුණිකව දන්වා සිටිමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු බව |

### 1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 චක්‍රලේඛයේ 7.2 ඡේදයෙහි වාර්තාකරණ ආයතනය විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරනු ලබන ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකල යුතු අතර, එම ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.30,567,623 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි. | මාර්ගෝපදේශ 7.2 ඡේදය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ACA - F) සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. ACA – 7 ආකෘතිය මගින් 2020 සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට ආකෘතියේ සඳහන්ව නොතිබි බැවින් ඉදිරිපත් නොකරන ලදී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු බව |

### 1.6.3 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

----------------------------------

#### 1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය අතර other structure යටතේ outdoor sports & recreation facilities රු .71,503,757 ක වෙනසක් පැවති අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල සටහනක් මගින් හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන්හි 2020.12.31 දිනට ශේෂයන් දෙපාර්තමේන්තු ලෙජර් ශේෂයන් හා Web Interface හි කේවල ශේෂයන් පරීක්ෂා කිරීමේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ආරම්භක ශේෂය නිවැරදි නොවිනි. දෙපාර්තමේන්තු ලෙජර් වලට අනුව 2020.12.31 දිනට සකස් කරන ලද ACA 06 ආකෘති | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු බව |

| | | |
|---|---|---|
| | | යෙහි (9151-1-3) Other Structure (61113)හි නිවැරදි ශේෂය වන එම වටිනාකම සහ Cumulative Non-Financial Asset Account Report - 2020 Final හි ශේෂය අතර පැවති රු.71,503,757 ක වෙනස රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත වරින් වර යොමුකරන ලද ලිපි මඟින් නිවැරදි කර ගන්නා ලදී. මෙවැනි තොරතුරු සඳහන් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙනම අකෘතියක් හඳුන්වා දී නොමැති අතර මින් ඉදිරියට මෙවැනි වෙනසක් පෙන්නුම් කරන්නේනම් අවසන් මූල්‍ය ප්‍රකාශයේදී සටහන් මඟින් අදාළ ගැලපීම් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.6.4 කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2021 ජනවාරි 01 දින අයවිය යුතු කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ රු. 214,180,450 ක් ශේෂය තුල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලට අදාළ රු.32,791,686 ක් වූ එකතු කිරීමේ බදු මුදල් ඇතුළත්ව තිබුණි | 2021 ජනවාරි 01 දිනට ශේෂය තුළ සම්පූර්ණ අත්තිකාරම් මුදලට අදාල VAT බදු මුදල අන්තර්ගත වන අතර 2021 වර්ෂය තුළදී පෙර වර්ෂවල හා ප්‍රවර්ථන වර්ෂය තුළ අය කරන ලද කුළී වැඩ අත්තිකාරම් වටිනාකමට අදාල වැට් මුදල අය කර ගන්නා ලදි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය තුල අයකර ගැනීමට ඇති අත්තිකාරම් මුදල හා එම මුදලට අදාල වැට් අන්තර්ගත වේ. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති රු.69,349,972 ක් වූ ශේෂය තුල අයකර ගැනීමට ඇති අත්තිකාරම් මුදල හා එම මුදලට අදාළ එකතු කළ අගය මත බදු මුදල ඇතුලත්ව තිබුණි | 2021 වර්ෂයේ විගණනය විසින් පෙන්වා දුන් පරිදි කුළී වැඩ අත්තිකාරම් තුල පැවති ශේෂයන්ගෙන් අයකරගෙන තිබු අත්තිකාරම් වටිනාකම්වලට අදාල VAT මුදල් 2021 වර්ෂයේදි අය කර ගන්නා ලදි. ඒ අනුව 2020 වර්ෂය වන විට අයකරගෙන තිබූ අත්තිකාරම්වලට අදාලව රු 12,782,874.84 මුදලක් VAT සංචිත ගිණුමෙන් මාරු කරන ලදී. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | 2021 වර්ෂයට අදාලව අයකරගත් අත්තිකාරම් වටිනාකම (Without VAT) රු.119,291,837.63 කි. 2021 වර්ෂයට අදාලව අයකර ගත් අත්තිකාරම් වටිනාකම්වලට අදාල VAT අගය රු. 12,755,764.83 කි. | |
| (ඇ) මන්නාරම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමට අදාලව ලබාදී තිබූ රු.40,962,026 ක් වූ (බදු සහිත) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල පිළිබඳව හා 2021 දෙසැම්බර් 31 දිනට එම අගයෙන් අයවීමට ඇති රු.14,277,972 ක් වූ (බදු රහිත) කුලී වැඩ අත්තිකාරම් ශේෂය මූල්‍ය ප්‍රකාශය තුල ගිණුම්ගත වී නොතිබුණි. | 2015 වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ප්‍රදානය කල අතර පුරා විද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2018.01.24 දිනැති ලිපිය මගින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබූ අතර නැවත වැඩ ආරම්භ කිරීමට අවසර ලබා දෙන ලද්දේ 2019.02.07 දිනය. ඒ වන විට මිල ගනන් වෙනස් වීම හේතුවෙන් මිල විචලනයන් අනුමත කර නැවත වැඩ ආරම්භ කළ අතර එම හේතු නිසා ඉදිකිරීම් ප්‍රමාද විය.<br><br>2015 වර්ෂයේ මෙහි වැඩ ආරම්භ කලද එම කාලයේ CIGAS වැඩසටහන නොතිබූ බැවින් එම ගිණුම් ගත වීමක් සිදු වී නොමැත.<br>මෙහි සංශෝධිත ඇස්තමේන්තු සකස් කර නැවත වැඩ ආරම්භ කළ අතර 2021 වර්ෂයේ ඉදිරිපත් වූ බිල්පත් මගින් අනාවරණය කිරීමට ඇත. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. | කුලී වැඩ අත්තිකාරම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශය තුල නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අය වැය ප්‍රතිපාදන උපයෝගී කරගෙන බැදීම් හා බැරකම් සඳහා එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශයට ලැබී තිබූ රු. 996,659 ක් වටිනා බිල්පත් 03 ක් මූල්‍ය ප්‍රකාශන වාර්තාවන්හි හා භාණ්ඩාගාර SA-92 වාර්තාවන්හි ඇතුළත් කර නොතිබුණි. | ගිවිසුම අනුව බැලීමේදී ගණනය කිරීම් වල දෝෂ තිබූ බැවින් දෝෂ නිවැරදි කර එවීම සඳහා උපදේශක ආයතනය වෙත යවන ලදී. බැරකම් ලේඛණය සකස් කරන අවස්ථාවේ එම බිල්පත් නොගෙවා තිබීම නිසා බැරකම් ලේඛණයට ඇතුළත් කර නොමැත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව බැදීම්වලට එළඹිය යුතු වීම. |

## 2.2 තැන්පතු

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු පිළිබඳව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු වුවද, වැඩ නිම කර දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලද ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළ තැන්පත් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 02 සිට 05 දක්වා රු.6,647,740 ක් වූ රඳවාගත් තැන්පතු 18 ක් සම්බන්ධයෙන් 2022 මැයි 25 දින වන විටද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | තැන්පතු ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 02 සිට 05 දක්වා හා වර්ෂ 05 ට වඩා පැරණි තැන්පත් වලින් මේ දක්වා කරන ලද ගෙවීම් සහ ගෙවීමට ගිණුම් අංශය සඳහා ඉදිරිපත් කර ඇති තැත්පතු අඩුකර ගෙවීමට ඇති ඉතිරි තැන්පතු දක්වා ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු පිළිබඳව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු වීම. |
| (ආ) රු. 1,277,020 ක් වටිනා කොන්ත්‍රාත් 05 කට අදාල නඩත්තු කාල සීමාව ඉක්මවා තිබුණද අවසන් බිල්පත් ඉදිරිපත් වන තෙක් ඒකී රඳවුම් මුදල් නිදහස් කර නොමැති බව නිරීක්ෂණය විය. | නඩත්තු කාලය ඉක්මවා ඇති ව්‍යාපෘති 5 සම්බන්ධයෙන් පහත කරුණු ඉදිරිපත් කරමි.<br>❖ හොකි ක්‍රීඩාංගනයේ විදුලි පහන් සවි කිරිම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත.<br>❖ මාතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නඩත්තු කටයුතු සඳහා ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු සුදානම් කරමින් පවතී<br>❖ කොටහේන ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරිම ව්‍යාපෘති සඳහා නගර සභාවේ නිර්දේශ ඉල්ලා ලිපි යවා ඇත<br>❖ පයාගල රාජිත සේනාරත්න ක්‍රීඩාපිටිය සඳහා CECB ආයතනයේ නිර්දේශය ඉල්ලා ලිපි යවා ඇත<br>❖ අලව්ව ප්‍රේක්ෂකාගාරය ඉදිකිරිම සඳහා ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු පිළිබඳව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු වීම. |

## 2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණයන් වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | . | |
| | | පිළිතුරු දක්වා නැත | |
| (අ) මුදල් රෙගුලාසි 139 | වවුචර්වලට ගෙවීම් කිරීමේදී ගණන් දීමේ නිලධාරීන් කටයුතු කල යුතු ආකාරය හා වවුචර්වලට ගෙවන නිලධාරියාගේ වගකීම් අනුව කටයුතු නොකර දෙපාර්තමේන්තුව විසින් 2021 ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කල ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා දීමනා ලෙස රු.26,328,910 ක් ගෙවීම් සිදුකර තිබුණි. | | වවුචර්වලට ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම හා ක්‍රීඩකයින් සඳහා ක්‍රීඩා අරමුදලෙන් සිදුකළ යුතු ගෙවීම් දෙපාර්තමේන්තු වැයවිෂයන් මගින් සිදු නොකිරීම. |
| (ආ) මුදල් රෙගුලාසි 177(1) | රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් හෝ තම තමන්ට ලැබෙන මුළු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් ප්‍රේෂණය කළ යුතු වේ. නමුත් 2020 වර්ෂයේ අපහරණය කරන ලද වාහන 04 කින් එක් වාහනයකට අදාල රු. 1,517,900 ක් වූ මුදල 2020 සැප්තැම්බර් 07 දින දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇතත් දෙපාර්තමේන්තුවේ දෛනික ගෙවීම් සඳහා මෙම මුදල් භාවිතා කිරිම හේතුවෙන් රු.1,291,000ක් පමණක් එදිනට බැංකුවේ තැන්පත් කර ඉතිරි මුදල් 2020 සැප්තැම්බර් 09 දින බැංකුවේ තැන්පත් කර තිබුණි | 2020 සැප්තැම්බර් 08 දින දෛනික ගෙවීම් සඳහා ලැබී තිබුණු රු.347,310ක චෙක් පත මුදල් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් දෛනික ගෙවිය යුතු මුදල් එදින අතැති මුදලින් ගෙවීම් සිදු කර දිනය අවසානයේදී චෙක්පත හා ඉතිරිව තිබූ මුදල බැංකුගත කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මුදල් රෙගුලාසි 260 | වවුචර්වල නම් සඳහන් තැනැත්තාට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන්ට පමණක් ගෙවීම් කළ යුතු වන අතර, වැරදි තැතැන්තන්ට මුදල් ගෙවීමක් නොසිදු වනු සඳහා සියලු ආරක්ෂා විධිවිධාන යොදාගත යුතු වුවද, ඔලිම්පික් උළෙලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ස්වීඩනයේ සිට සහභාගී වූ ක්‍රීඩිකාවකට ගෙවීමට තීරණය කරන ලද ඇමරිකානු ඩොලර් 1500 ක් සඳහා රු.3,043,350 ක් වූ චෙක්පතේ ආදායකයාගේ නම ලෙස ක්‍රීඩිකාවගේ නම ලියා තිබුණද පසුව එය වෙනස්කර එම ක්‍රීඩිකාවගේ එකඟතාවය ලබාගැනීමකින් තොරව එම මුදල හා එම ක්‍රීඩිකාවට ලබා දීමට තීරණය කරන ලද ඇමරිකානු ඩොලර් 40 ක් වූ අනියම් දීමනාව වන රු. 81,156 ක් සමග ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමයට ලබා දී තිබුණ අතර එම මුදල ක්‍රීඩිකාවට ලබා දුන් බවට සනාථන (විගණන දින වනවිටත් ) දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොතිබුණි. | පිළිතුරු දක්වා නොමැත. | වවුචර්වල නම් සඳහන් තැනැත්තාට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන්ට පමණක් මුදල් රෙගුලාසි අනුව ගෙවීම් කළ යුතු වන අතර ක්‍රීඩා සංගම් සඳහා ගෙවීම් කිරීමේදී නියමිත වැය වීෂය උපයෝගී කර ගතයුතුවීම. |
| (ඈ) මුදල් රෙගුලාසි 880 හා 891 | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව හා මුදල් රෙගුලාසි 880 හා 881 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 15 ක් අතුරින් 06 දෙනෙකු පමණක් ඇප තැන්පත් කර තිබුණි. | නිළධාරීන් 07 දෙනෙකුගේ ඇප බැඳුම්කර ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට ලිඛිතව දන්වා ඇති අතර තවත් නිළධාරීන් දෙදෙනෙකුගේ ඇප බැඳුම්කර ආකෘති පත්‍ර සම්පූර්ණ කර යවා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය 01 ඡේදය | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන තෙක් වාර්ෂික ගිවිසුම් අත්සන් කර නොමැති අතර, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ)2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) ඡේදය | ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර එකී ක්‍රියාකාරි සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2021 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා සංගම්වල ක්‍රියාකාරි සැලසුම් ඉදිරිපත් කර තිබුණේ ක්‍රීඩා සංගම් 65 කින් ක්‍රීඩා සංගම් 19 ක් පමණි | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කිහිප වරකදීම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන ලිඛිතව, දුරකථනය හා විද්‍යුත් තැපැල මඟින්ද 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස දැනුවත් කර වාර්ෂික සැලසුම් ගෙන්වාගෙන ඇත. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සියළු ක්‍රීඩා සංගම් නියාමනය කළයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ යෝජිත හා පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 13 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1155 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන 324 ක් විය. ව්‍යාපෘති විවිධ හේතුමත නිම නොකර අත්හැර දමා තිබීම හේතුවෙන් මෙතෙක් වැය කර ඇති රු.මිලියන 324 ක මුදල නිශ්කාර්යය වියදමක් වී තිබුණි. | 2021 වර්ෂයේ යෝජිත හා පෙර වර්ෂ වල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 13 ක් අතුරින් ඉදිකිරීම් ආරම්භ නොකළ ව්‍යාපෘති 04 ක්ද,ප්‍රතිපාදන නොමැති වීම මත ඉදිකිරීම් නතරවී ඇති ව්‍යාපෘති 03 ක්ද, විවිධ හේතු මත ඉදිකිරීම් අත්හිටුවා ඇති ව්‍යාපෘති 06 ක් ද පවතී. | ආරම්භ කරන ලද ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නියමිත දිනට ඉදිකිරීම් සාර්ථකව නිමකළයුතු බව. |

**3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ යෝජිත හා පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 33 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1834 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට වැයකර ඇති වියදම රු. මිලියන 1796.83 ක් විය. විවිධ හේතුන් මත මෙම ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබුණි. ව්‍යාපෘති 10ක පමණක් වැඩ නිමකර තිබුණු අතර තවත් ව්‍යාපෘති 07 ක වැඩ අවසන් කර භාරගෙන තිබුණි. පවතින ආර්ථික අර්බුද හමුවේ ප්‍රතිපාදන සලසා ගැනීමේ දුෂ්කරතාවයක්ද පවතින හෙයින් මෙම ව්‍යාපෘති සඳහා මෙතෙක් වැයකර ඇති වියදමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම අපහසු වී තිබුණි. | 2021 වර්ෂයේ යෝජිත හා පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 24 ක් අතුරින් ව්‍යාපෘති 10 ක ඉදිකිරීම් අවසන් කර භාරගැනීමට නියමිත අතර , තවත් ව්‍යාපෘති 07ක් ඉදිකර අදාල පාර්ශවයන් වෙත හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාරගෙන ඇත.එසේම තවත් ව්‍යාපෘති 16 ක ඉදිකිරීම් සිදුකරමින් පවතී. | කිසියම් ව්‍යාපෘතියක් සඳහා නියමිත වූ කාල පරිච්ඡේද තුල අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව. |

**3.3 වත්කම් කළමණාකරණය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම | | |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි 2021 දෙසැම්බර් 31 දින වන විට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.<br>I. අංක 33 ටොරින්ටන් පෙදෙස - කොළඹ 07<br>II. හොකී ක්‍රීඩා පිටිය 100/10 නිදහස් මාවත කොළඹ 07<br>III. හොකී ක්‍රීඩා පිටිය අසළ නේවාසිකාගාරය 100/08 නිදහස් මාවත කොළඹ 07<br>IV. මාතර කොටවිල ක්‍රීඩාංගනය මාතර<br>V. පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණය | ලේඛනගත නොවූ වත්කම් ලේඛණයෙහි දක්වා තිබූ ස්ථාන 9 න් අංක 94/119 හි සඳහන් කුවින් එලිසබත් ක්‍රීඩපොටාය, නුවරඑළිය තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින් අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ටොරින්ටන් හා රිඩ් ඇවනිව් පිහිටි නේවාසිකගාරයන්හි වත්කම් තක්සේරු කර ගිණුම් ගත කර ඇත. ඉතිරි වත්කම් තක්සේරු කිරීම පිළිබද වර්තමාන තොරතුරු දක්වා ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කලයුතු වීම. |

4. **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද තෘතිය මට්ටමේ පුරප්පාඩු 12 ක්ද, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 59 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 18 ක්ද පැවතුණු අතර එය තුළ ඇතුළත් දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාර්ය සාධනය සඳහා බෙහෙවින් බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් සහ ක්‍රීඩා කටයුතු සම්බන්ධ කාර්යමණ්ඩලයේ තනතුරු 7 කට අදාළ පුරප්පාඩු 52 ක් පැවති බව නිරීක්ෂණය විය | පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. | පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අනුගතව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජුවම බලපාන පුරප්පාඩු පිරවීම. |